"මත්ලෝලීන් උසිගැන්වූ කොරෝනාව බැඳ දමමු!" යන මැයෙන් යුතුව, අරුණ පුවත්පතේ පළවූ ලිපියකි. එය වෛද්‍ය ජී.ජී.චමල් සංජීව හා සිදුකළ සම්මුඛ සාකච්ඡාවකි.

කොවිඩ්-19 පුවත් වාර්තා කිරීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශනයන් මගින් පෙන්වා දෙන්නේ, කොවිඩ්-19 ආසාදනය වූවන් රෝගීන් ලෙසින් මිස රෝගය පතුරුවන්නන් ලෙසින් හැඳින්වීම නොකළ යුතු බවයි. එනම්, රෝගීන් වෙත රෝගය පතුරුවන්නන් ලෙසින් දෝෂාරෝපණය නොකළ යුතු බවයි.

මෙම සිරස්තලය ඔස්සේ එවන් දෝෂාරෝපණ අදහසක් ගම්‍ය වන්නේ යැයි ඔබ සිතන්නේද? මෙම සිරස්තලය පිළිබඳ ඔබගේ සමස්ත අදහස කුමක්ද?
එසේම, 'මත්ලෝලීන්' ලෙසින් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් හැඳින්වීම කෙතරම් යෝග්‍ය වන්නේද? මත්ද්‍රව්‍ය වෙත ලොල් වූවන් යන අදහස දෙන එවැනි යෙදුම් ඔස්සේ, ඔවුන්ව සමාජයෙන් තවදුරටත් කොන් කිරීමක් සිදුනොවන්නේද? ඒ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #News #Aruna